රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

அரசாங்க தகவல் திணைக்களம்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களையும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளையும் பாராளுமன்றத்திற்கு சமர்பித்தல்.

Department of Government Information

Submission of Observations of Hon Minister And Steps Taken With Regard To The Reports Tabled By The Committee On Public Accounts In Terms of Standing Order No-119(4)

අංක 119 (4) දරණ ස්ථාවර නියෝග පරිදි රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද වාර්තාවේ නිරීක්ෂණ හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු ග්‍රන්ථමාලා අංකය : 183
ආයතනයේ නම : රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

2020 වර්ෂය සඳහා මූල්‍ය හා කාර්යසාධන ඇගයීමේදී හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
01. හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	2022.12.31 දක්වා යාවත්කාලීන කර ඇත.
02. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	කොවිඩ් වසංගතය පැතිරයාම හේතුවෙන් පැන නැගුණු හදිසි තත්වය මත විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු සැපයීමට නොහැකි වී ඇත. මේ වනවිට නියමිත දිනයන් හිදී විගණන විමසුම සඳහා පිළිතුරු සැපයීම ට කටයුතු කර ඇත.
03. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාර 2018.08.01 දිනෙන් පසුව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණක වරයෙකු නොමැති බැවින් අභ්‍යන්තර විගණන වාර්තා කිසිවක් නිකුත්කර නොමැත.
04. මු.රෙ. 134(2), මු.රෙ. 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණකවරයෙකු නොමැති බැවින් අභ්‍යන්තර විගණන වාර්තා කිසිවක් නිකුත්කර නොමැත.
05. 2016.03.31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2020.12.31 දිනට අදාළ භාණ්ඩ සමීක්ෂණයේ අවසන් වාර්තාව විගණකාධිපති වෙත 2022.02.25 දින යවා ඇත.
06. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2022 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සමඟ අවසන් කිරීමට කටයුතු කරමින් පවතී.

07. 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	2020,2021 වර්ෂය සඳහා ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොනිබූ අතර පැවති ඉන්ධන ගැටලු හේතුවෙන් කිරීමට නොහැකි වුණි. 2023 වසර සඳහා ඉදිරියේදී සිදු කිරීමට සැලසුම් කර ඇත.
08. බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	නිරවුල් කර ඇත.
09. මු.රෙ. 94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කර ගෙන තිබුණි	කොවිඩ් වසංගතය පැතිරයාම හේතුවෙන් පැන නැගුණු හදිසි තත්වය මත දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටුකිරීමේදී ඇතැම් වැය විෂයන් යටතේ පැවති ප්‍රතිපාදන ඉක්මවා බැඳීම් බැරකම් වලට එළඹීමට සිදු විය. නමුත් ඉන්පසු එළඹී වර්ෂ වලදී නොවැළැක්විය හැකි හේතූන් මත හැර අනිකුත් සියළුම අවස්ථා වලදී පැවති ප්‍රතිපාදන නොඉක්මවන ලෙස බැඳීම් බැරකම් වලට එළඹීමට කටයුතු කර ඇත. ඉදිරියේදී තවදුරටත් එම තත්වය වළක්වා ගැනීමට කටයුතු කරන බව දැනුම් දෙමි.
10. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	10. සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු ණය ශේෂ ඕ.සී.එල්. ද සිල්වා මයා ණය ශේෂය දේපළ රු. - 123,475.00 එම්. ආරියරත්න මයා ණය ශේෂය ආපදා රු. - 56,265.00 1997 වර්ෂයේදී සේවය හැර ගිය ඕ.සී.එල්. සිල්වා මහතාගේ දේපළ ණය ශේෂය වන රු. 123,475.00ක මුදලත්, 2001 වර්ෂයේදී සේවය හැර ගිය එම්. ආරියරත්න මහතාගේ ආපදා ණය ශේෂය වන රු. 56,265 ක මුදලත් අය කර ගැනීම සම්බන්ධයෙන් තොරතුරු සහ ලේඛන පිටපත් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර අදාළ උපදෙස් ලැබීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමි.
11. පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	කල් ඉකුත් වූ තැන්පතු වනුයේ නව මාධ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදි කිරීම් කොන්ත්‍රාත්තුවට අදාළ රඳවා ගැනීම් මුදල් වේ. අලාභ අය කිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතින බැවින් රැඳවුම් මුදල් නිදහස් කර නොමැත.
12. මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ නත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යයන්හි ස්වභාවය අනුව එම කටයුතු ඉටු කිරීමේදී වාර්තා චිත්‍රපට නිපදවීම් ආදී සමහර කාර්යයන් සඳහා තරමක කාලයක් ගත වන අතර එම කටයුතු නිම වන තෙක් ලබාගත් අග්‍රිම පියවීමේ ප්‍රමාදයන් ඇති වේ. බොහෝ අවස්ථාවන්හිදී කාර්යයට අදාළ වියදම් නිම වූ වහාම ඉතිරි මුදල් පියවීම් සිදු කරන අතර වාර්තා චිත්‍රපට නිපදවීම් වැනි කාර්යයන්හිදී සංස්කරණය වැනි කාර්යයන් නිමකර අවසාන නිෂ්පාදනය එළි දැක්වීමට අමතර කාලයක්ද ගතවන බැවින් බිල්පත් ගොනුකර අත්තිකාරම් පියවීමේ වවුචර්පත් ඉදිරිපත් කිරීමට තරමක් ප්‍රමාද වේ. තවද නිරතුරුවම අත්තිකාරම් ලේඛන

	පරීක්ෂා කරමින් නොපියවූ අත්තිකාරම් පියවන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරමින් මෙවන් තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.
13. සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු කාර්යසාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	2020 හා 2021 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තා විගණකාධිපති වෙත යවා ඇත. 2022 වර්ෂය සඳහා පිළියෙළ කරමින් පවතී.
14. ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගැනීම සඳහා කමිටුවක් පත් කර අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
15. හඳුනාගත් තිරසර අරමුණු ඉලක්ක ලභා කර ගැනීම මැන බැලීම සඳහා කාර්යසාධන ඉලක්ක නියම කර නොතිබුණි.	ඉහත 14 අනුව කටයුතු සිදු කරමින් පවතී.
16. ආයතනයේ තිරසර අරමුණු ඉලක්ක ලභා කර ගැනීමට අදාල වන නිශ්චිත පාර්ශව හඳුනාගෙන නොතිබුණි.	ඉහත 14 අනුව කටයුතු සිදු කරමින් පවතී.
17. 2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරන චක්‍රලේඛ විධි විධාන අනුව ඉටු කළ යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කළ යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳව විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතබුණි.	ඉහත 14 අනුව කටයුතු සිදු කරමින් පවතී.
18. පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන තෙක් සකස් කර නැත.
19. ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	මේ වන තෙක් සකස් කර නැත.
20. රාජ්‍ය පරිපාලන විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	මේ වන තෙක් සකස් කර නැත.
21. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	මේ වන තෙක් සකස් කර නැත.
22. සමස්ථ කාර්ය මණ්ඩලය ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	මේ වන තෙක් ගිවිසුම් අත්සන් කරගෙන නැත.

23. මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	මේ වන තෙක් නම් කර නැත.
24. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබුණු පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	වියදම් පාලනය කිරීම සඳහා වියදම් කප්පාදු කිරීමට සිදුවීමෙන් හැකි උපරිම ධාරිතාවයෙන් පුහුණු අවස්ථා ලබාදීම.
25. විගණකාධිපතිවරයා විසින් ඡේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු/ දෝෂ නිවැරදි කරවාගෙන නොතිබුණි.	රටේ පැවති අහිතකර වාතාවරණය මත විගණකාධිපතිවරයා විසින් පෙන්වා දී තිබූ යම් යම් අඩුපාඩු නිවැරදි කිරීමට නොහැකි විය. ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.
26. අයවැය චක්‍රලේඛය අනුව අවම වශයෙන් නිමැවුම් දර්ශක තුනක් හඳුනාගෙන ලේඛන ගත කර නොතිබුණි.	2020 වර්ෂය සඳහා අයවැය චක්‍රලේඛය අනුව නිමවුම් දර්ශක තුනක් හඳුනාගෙන නැත.
27. ආයතනය විසින් ඉටු කරනු ලබන කාර්යභාරය හා සම්බන්ධිතව ප්‍රධාන කාර්ය දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	මෙය ප්‍රමාද දෝෂයක් හේතුවෙන් සටහන් කිරීම ට නොහැකි වී ඇති අතර 2020 වර්ෂය සඳහා ආයතනය විසින් ඉටු කරනු ලබන කාර්යභාරය හා සම්බන්ධ ව ප්‍රධාන කාර්ය දර්ශක 03 ට වඩා (විශේෂිත දර්ශක 18ක්) හඳුනාගෙන තිබුණි.
28. හඳුනාගත් පළමු කාර්යසාධක දර්ශකයේ ලභාවීම 50%ට වඩා අඩු ප්‍රමාණයෙන් විය. හඳුනාගත් දෙවන කාර්යසාධක දර්ශකයේ ලභාවීම 50%ට වඩා අඩු මට්ටමක විය. හඳුනාගත් තුන්වන කාර්යසාධක දර්ශකයේ ලභාවීම 50%ට වඩා අඩු මට්ටමක විය.	හඳුනාගත් කාර්ය සාධක දර්ශකවලින් බොහෝමයක් (14ක්) 50% - 100% මට්ටම ට ලභා වී තිබුණි.අනෙකුත් දර්ශක ප්‍රතිපාදන සීමා කිරීම් හා කොවිඩ් -19 බලපෑම් හේතුවෙන් ලභා කිරීමට බාධා පැවතුණි.

දිනිත් චින්තක කරුණාරත්න
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ 05.